# පිනි බිංදුවක රහස



මෙනායා යොමින්දි ගුණතිලක

# පිනි බිංදුවක රහස

## මෙනායා යොමින්දි ගුණතිලක

(පළමු දිග හැරීම)

මහාමායා බාලිකා විද්‍යාලය
7 ශ්‍රේණිය G
2026.06.14

# පිදුම

මගේ ආදරණීය

මවටත් ,

පියාටත් ,

සහෝදරයාටත්

සෙනෙහසින්

පුදමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකි ය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක් ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමූදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන් ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැ වී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන් වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ  කර ඇති  හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින්  නිර්මාණය වූ  ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාෂිංසන පණිවිඩයක්  එක් කිරීමට ලැබීම  මා ලැබූ  භාග්‍යයක් කොට  සළකමි.

අධ්‍යාපනය යනුවෙන් සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර , එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා  තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා , නිර්මාණශීලීත්වය සහ  බුද්ධිමය හැකියාවන්  මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලි ය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයට ම  වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම , මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි  බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා  කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය , සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශාංසාව  සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ  උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක්  ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# පිනි බිංදුවක රහස

එකොමත් එක කාලෙක පුංචි ගමක් තිබුණා. මේ ගමට නියඟයක් ඇවිල්ලා තිබුණි.මේ ගමේ ඉන්න මිනිස්සු වගේ ම ම සතුන් දුක් වුණා. ඒ අතර තිසර කියලා පුංචි ළමයෙක් කුඹුරක ගහක් යට වාඩි වෙලා අඬමින් සිටියේ ය. තිසර ළඟ තිබුණු ගහේ අන්තිම කොළය තිසරගේ අතට වැටුණා. ඒ කොළේ පුංචි පිනි බිංදුවක් තිබුණා. මේ පිනි බිංදුව තිසරගේ අතේ නතර වුණා.



තිසර අඬන එක නතර කළා. පිනි බිංදුව තිසරට කතා කළා. තිසරට පුදුම හිතුනා. තිසර පිනි බිංදුවගෙන් ඇහුවා ''ඔයා කවු ද'' ? පිනි බිංදුව කිව්වා.

''මම පිනි බිංදුවක් මගේ නම බිංදු'' කියලා ඊට පස්සේ තිසර ඇහුවා ''ඔයා කොහොම ද මෙතනට ආවේ '' ? කියලා බිංදු කිව්වා ''මං අහසේ ඉදලා මේ ගහේ කොළේකට වැටුණා. එතකොට මං ඔයාගේ අතට වැටුණා'' කියලා කිව්වා. තිසරට හරි පුදුමයි. ඉන් පසු බිංදු ඇහුවා ඇයි ඔයා අඬ අඬ හිටියේ කියලා. තිසර කිව්වා ''අපේ ගමට නියඟයක් ආ බවත් ඒ නිසා ගමේ මිනිස්සු දුක්වන බවත් කීවා''

මේ කතාව ඇහුව බිංදුට තිසර ගැනත් තිසරගේ ගම ගැනත් ලොකු කනගාටුවක් ඇති වුණා. ඊට පස්සේ බිංදු හිතනවා මම තිසරට උදවු කරන්න ඕනෑ කියලා. ඉන් පසු පිනි බිංදුව තිසරට කිව්වා ''මට පුළුවන් ඔයාට උදවු කරන්න. ඔයාගේ ගම සරුසාරවත් ගමක් කරන්න'' කියලා. මේ කතාව ඇසූ තිසරට ගොඩක් සතුටු හිතුණා. මීළඟට තිසර කියුවා'' යමු බිංදු මම ඔයාට මගේ ගම පෙන්වන්නම් කියලා''. තිසර බිංදුට ගම පෙන්වන්න එක්කගෙන ගියා. මේ ගමනේ දී එක් ගහක්වත්, කොළයක්වත් බිංදුට දැකගන්න ලැබුණේ නෑ. බිංදු කිව්වා අපි මේ ගමේ ගස්වැල් ටිකක් රෝපණය කරමු.'' කියලා. තිසර ඒ අදහසට එකපයින් කැමති වුනා. ඉන් පසු බිංදුයි තිසරයි තිසරගේ යාළුවොයි ගස් රෝපණය කරන්නට පටන් ගත්තා. එක දවසක් මේ යාළුවෝ ගස් සිටවමින් ඉද්දී බිංදු එක පාරටම බිම ඇඳගෙන වැටුණා. තිසර ගොඩාක් කලබල වුණා. ඒත් එක්කම පියඹාගෙන ආ මයිනෙක්

පිනි බිංදුවට සෙවන ලැබෙන සේ සිටියා. මේ ගමේ සත්තු ගොඩක් කරුණාවන්තයි.



ඉන් පසු පිනි බිංදුව අවදි වුණා. තිසර බිංදුගෙන් සිදු වු දෙය විමසුවා. ''බිංදු මට ගොඩක් වෙලා සිසිලයි. සෙවනයි. නොමැතිව ඉන්න බැහැ'' කියා කීවා. බිංදු සහ ළමයින් ටික ටික වේලාවක් විවේක ගන්න. මේ අතර ගමේ සිටි නපුරු මුදලාලි කෙනෙකුට ගම සරුසාරවත් කරන විශිෂ්ඨ පිනි බිංදුව ගැන ආරංචි වුණා. මේ වේලාවේ නපුරු මුදලාලිට ''මම මේ පිනි බිංදුව රැගෙන මිනිසුන්ට ප්‍රදර්ශනය කර මුදල් උපයා ගන්න ලෙස නපුරු සිතුවිල්ලක් පහළ වුණා. මේ නපුරු අදහසත් සමඟ මුදලාලි ක්‍රියාත්මක වුණා. තවත් අලුත් දවසක් උදා වුණා. ඒ වේලාවේ බිංදු ගහක් යටට වෙලා

නිදාගෙන සිටියා. මේ වේලාවේ අර නපුරු මුදලාලි බෝතලයක් අරන් ඇවිත් බිංදුව අල්ලා ගත්තා. මේ වේලාවේ බිංදුට එක පාරට ම ඇහැරුණා.

බිංදු ගොඩක් කලබල වුණා. බිංදු ගොඩක් කෑගහලා උදව් ඉල්ලුවත් ඒ
වේලාවේ එතැන බිංදුට උදව් කරන්න කවුරුත් හිටියේ නැහැ.

ටික වේලාවකට පස්සේ තිසරයි තිසරගේ යාළුවොයි බිංදුව හොයාගෙන ආවා. එහෙත් බිංදු නිදා සිටි තැන නොමැති බව දැකීමෙන් තිසර බියට සහ කලබලයට පත් වුණා. ළමයින් වටපිට බැලුවා. එවිට ළමයින් දැක ගන්නට හැකි වුණා.ගමේ මිනිසුන් විකුණන මුදලාලිගේ කඩේ ඉදිරිපිට එක්රුස් වී සිටිනවා.




තිසර සහ ළමයින් ද සිදු වී ඇති දේ සොයා බැලීමට කඩේ අසලට ගියා. එවිට ළමයින් දුටුවේ පුදුම සහගත දර්ශනයකි. ළමයින් දුටුවේ තමන්ගේ යාළුවා වන බිංදු කඩේ ඉදිරිපිට බෝතලයක් ඇතුළට දමා මිනිසුන්ගෙන් මුදල් ගෙන ප්‍රදර්ශනය කරන ආකාරයයි. ඒ වේලාවේ තිසරගේ හිතට මුදලාලි ගැන තරහක් ඇති වුණා. එවිට ම තිසරගේ සිතට ආ තරහට ඉදිරියට ගොස් බිංදුව බේරා ගැනීමට තිසර සූදානම් විය. එහෙත් තිසරගේ යහළුවන් එයට ඉඩ නොදුන්නා. ''අපි සැලැස්මකට අනුව බිංදුව බේරා ගමු'' යැයි ඔවුන් තිසරට කිවෝ ය. තිසර එයට එකඟ වුණා. ඔවුන්ගේ සැලැසුම වූයේ එක් ළමයෙක් ගොස් මුදලාලි සමඟ කතා කරන විට තිසර ගොස් බිංදුව බේරා ගැනීමයි.

ඔවුන්ගේ සැලැස්ම ක්‍රියාත්මක වුණා. ඔවුන් සිතූ ආකාරයට ම බිංදුව බේරාගන්නට ඔවුන්ට හැකිවුණා. එවිට බිංදුගේ සිතේ ඇතිව තිබූ බිය සහ කළබලකාරී හැඟීම මේ වන විට පහව ගොස් තිබුණි.බිංදු තිසරට සහ තිසරගේ යහළුවන්ට බොහෝ ස්තූති කළේ ය.

එහෙත් තිසරගේ සිතට මුදලාලි ගැන කනස්සලක් ඇති වුණා. බිංදු ඒ ගැන අසද්දි තිසර මෙසේ කීවේ ය. ''මට හරි ම කණගාටුයි අර නරක මුදලාලි ගැන'' කියලා මේ වේලාවේ ඇත්තට ම තිසරට ඕන වුණේ නැවතත් ගොස් මුදලාලිට මේ පිළිබඳ ව පහදා දෙන්නයි. තිසර සිතූ ආකාරයට ම තිසර ද බිංදු ද නැවත මුදලාලිගේ කඩය අස්සට ගියේ ය. නපුරු

මුදලාලි නැති වු පිනි බිංදුව සොයන ආකාරයට දුටු විට තිසරගේ සහ බිංදුගේ මුවට සිනා නැගුණි. ඒ වේලාවේ තිසර සහ බිංදු එතැනට ගොස් මුදලාලිට මෙසේ කීවේ ය.'' ''මුදලාලි මාමේ මේ පිනි බිංදුව කාගෙවත් නොවෙයි, මේ පිනි බිංදුව අපිට උදව් කරනවා අපේ ගම සරුසාරවත් කරන්න. ඉතින් මාමාත් උදව් වෙනවා නේද ? '' මේ වේලාවේ තමන් කරපු වැඩේ ගැන කණගාටුවක් සහ ලැජ්ජාවක් ඇති වුණා.



ඉන් පසු මුදලාලි මෙසේ කිවේ ය. ''ඔව් ළමයිනේ මමත් උදවු කරනවා. ඒ වගේ මම කරපු වැඩේ වැරදි මට සමාවෙන්න.'' කියලා ඉන් පසු තිසරයි බිංදුයි මුදලාලි මාමයි සෑම දෙනාම පරිසරය ලස්සන කලා. දැන් තිසරගේ ගම හරිම ලස්සනයි. පිරිසිදුයි.

නිස්කලංකයි. ඊට පස්සේ තිසර කිව්වා''බිංදු නිසා තමයි අපේ ගම මෙච්චර ලස්සන වුණේ. එයා නැත්නම් අපි තාමත් දුකෙන්  ඉන්නවා. ඔයාට ගොඩක් ස්තූතියි. කියලා. මීළඟට  බිංදු කිව්වා''මටත් හරිම සතුටුයි. මේ ගම ගැන. ඒ වගේ ම මට හොඳ යාළුවොත් හමු වුණානේ'' කියලා. දැන් ඉතින් බිංදුටයි තිසරටයි සමුගන්න වේලාව හරි. බිංදු තිසරව ද අතිත් ළමයින් ද සතුන්ට ද මුදලාලි මාමාට ද වැළඳගෙන ඔවුන්ගෙන් සමු ගත්තේ ය. ''ම නැවතත් ඔයාලාගේ ගමට වැස්සක් අරගෙන එන්නම්'' කියා අහසට ඇදී ගියා. දැන් තිසරගේ ගම සෑම අතකින් ම සරුසාර විය.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරු දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමී ව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන් ම පොතපත ද සම ව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසා ය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන් ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **''හේමමාලා උපහාර''** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන් ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)